# 10 ශුද්ධ වූ සභාවේ ලක්ෂණ

ඉරුදින දිව්‍ය පූජාව අවස්ථාවේ "විශ්වාස ලක්ෂණය" උච්චාරණය කරන විට " අපෝස්තුලුවරුන්ගෙන් පැවත එන එක ම ශුද්ධ වූ කතෝලික සභාව කෙරෙහි මම විශ්වාස කරමි" යනුවෙන් අපි පවසමු. මෙම විශ්වාසයේ වගන්තිය, ශුද්ධ වූ සභාව තුළ පැවතිය යුතු අනිවාර්ය ලක්ෂණ හතරක් ගෙනහැර දක්වයි.
ඒවා නම් :

1. ඒකත්වය
2. ශුද්ධත්වය
3. කතෝලිකත්වය
4. අපෝස්තලිකත්වය

## 1. ඒකත්වය

ඒකත්වය යනුවෙන් අදහස් කරන්නේ ශුද්ධ වූ සභාවේ එකමුතුකම යි. ශුද්ධ වූ සභාවේ එකමුතුකමේ පදනම ශුද්ධ වූ ත්‍රිත්වය යි. ශුද්ධ වූ සභාවට සියලු සාමාජිකයන් කැඳවා ඇත්තේ පියාණන් වහන්සේ ය. මේ සියලු දෙනා අයත් වන්නේ පුත්‍රයාණන් වහන්සේට ය. එසේ ම සියලු දෙනා ශුද්ධාත්මයාණන් වහන්සේගෙන් පරිපූර්ණ කර ඇත. මෙය ශුද්ධාත්ම ක්‍රිස්තු දේහය නමැති සංකල්පය තුළින් ද පැහැදිලි කළ හැකි ය. එනම් ජේසුස් වහන්සේ ශුද්ධ වූ සභාවේ හිස වන සේක. ප්‍රසාද ස්නාපනය ලැබූ අය ජේසුස් වහන්සේගේ පරම ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයේ අවයවයෝ වෙති. ශරීරය හිසින් හෝ අවයව ශරීරයෙන් ඉවත් වුවහොත් ශුද්ධාත්මික ක්‍රිස්තු දේහය විකෘති වේ; අංග විකල වේ (1කොරින්ති 12:13).

ඒකත්වයට එරෙහි වූ බාධා එදත් අදත් පවතියි. පාපය ඇති තැන බෙදීම් වෙදභේද හා ආරවුල් ඇති වේ. ඒවා නිරාකරණය කර ගැනීමට කටයුතු කිරීම ශුද්ධ වූ සභාවේ සැමගේ වගකීමකි. පළමු ව ශුද්ධ වූ සභාවේ ඒකත්වය වෙනුවෙන් සියලු දෙනා යාච්ඤා කළ යුතු ය. ජේසුස් වහන්සේ ද ශුද්ධ වූ සභාවේ එකමුතුකම වෙනුවෙන් යාච්ඤා කළ සේක.

> "මොවුන් (ශ්‍රාවකයන්) ගැන පමණක් නොව මොවුන්ගේ වචනය කරණ කොට ගෙන මා අදහා ගන්නා අය (අනාගත ශුද්ධ වූ සභාව) ගැනත් යාච්ඤා කරමි. පියාණෙනි, මා මෙසේ කරන්නේ ඔබ මා තුළ ද මා ඔබ තුළ ද සිටින්නාක් මෙන්, ඔවුන් ද අප තුළ ඒකත්වයක් වන පිණිස ය."
>
> (ජොහන් 17:20-21)


නොමිලේ බෙදාහැරීම සඳහා ය.

තව ද මීසම් සංඝයේ සියලු දෙනා සමගි ව කටයුතු කරන අතර අන් කිතුනු සභා (ප්‍රධාන කිතුනු සභා) සමග සමගියෙන් හා සහයෝගයෙන් කටයුතු කළ යුතු වෙමු.

## 2. ශුද්ධත්වය

යමක් හෝ යමෙක්, දෙවියන් වහන්සේට ඇති සම්බන්ධතාව මත "ශුද්ධවන්ත" වේ. උදා: ශුද්ධ වූ දේශය, ශුද්ධ වූ බයිබලය, ශුද්ධ වූ ලේන්සු හා ශුද්ධ වූ පින්තූර. ශුද්ධ වූ සභාව ද ශුද්ධවත් වන්නේ එය ශුද්ධ වූ ත්‍රිත්වයට ඇති සම්බන්ධතාව මත ය.




ශුද්ධ වූ සභාව ශුද්ධ වූ ත්‍රිත්වයට ඇති මෙම සබඳතාව මත එය ශුද්ධවන්ත වේ. ශුද්ධ වූ සභාවේ එම ගුණාත්වය කිසි දිනක නැතිවිය නොහැකි ය. එහෙත් ශුද්ධ වූ සභාවේ සාමාජිකයන් වන අප පව් කරයි. ශුද්ධ වූ සභාව පව්කරුවන් පවා තම තුරුළට ගනිමින් පාපී මාර්ගවලින් හැරී දෙවියන් වහන්සේ වෙතට ගමන් කිරීමට ඔවුන් ව යොමු කරවයි. එබැවින් අපගේ පව්වලට දුක් මනස්ථාප වෙමින්, අපගේ පව්වලට සමාව ලබා ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීම අපගේ ද යුතුකම වන්නේ ය.

## 3. කතෝලිකත්වය (සාධාරණත්වය)

"කතෝලිකත්වය" යනුවෙන් අදහස් කරනුයේ ශුද්ධ වූ සභාවේ විශ්වීය බව යි. එනම් එය එක ජාතියකට, එක දේශයකට, එක ප්‍රදේශයකට සීමා වී නැත. ශුද්ධ වූ සභාවේ කතෝලිකත්වය දෙවැදෑරුම් ලෙස විස්තර වේ.

1. ශුද්ධ වූ සභාව "කතෝලික" වනුයේ ක්‍රිස්තුන් වහන්සේ ඇය තුළ විද්‍යාමාන වන නිසා ය.
2. ශුද්ධ වූ සභාව "කතෝලික" වනුයේ, ඇය ව සකල මිනිස් වර්ගයා වෙත ම දූත මෙහෙවර සඳහා ක්‍රිස්තුන් වහන්සේ විසින් යවා ඇති නිසා ය. එම නිසා ශුද්ධ වූ සභාව ධර්මදූතයේ යෙදෙයි.

ශුද්ධ වූ සභාවේ විශ්වීය බව වර්ධනය වන්නේ සුබාරංචිය සියලු දෙනා වෙත ගමන් කළ පමණට ය. එබැවින් ශු. සභාව ධර්මදූතයේ යෙදෙමින් එම විශ්වීය බව ව්‍යාප්ත කරන්නී ය. අප අන් අයට හැකි අයුරින් දේව වචනය කියා දිය යුතු ය. එවිට දේව වචනය ගැන පැහැදී ඒ අය ද සුබාරංචිය විශ්වාස කරනු ඇත. එය ශුද්ධ වූ සභාවේ කතෝලිකත්වය වැඩි කිරීමට හේතු වේ.

## 4. අපෝස්තලිකත්වය

අපෝස්තලිකත්වය යනුවෙන් අදහස් වන්නේ අපෝස්තුලුවරුන් හා වත්මන් ශුද්ධ වූ සභාව අතර වන දූත කාර්යයේ අනන්‍යතාව යි. අපෝස්තුලුවරයා යනු යවනු ලැබූ තැනැත්තා ය. ශුද්ධ වූ සභාව අපෝස්තුලුවරුන්ගේ විශ්වාස, ජීවිතය හා සේවාව නොකඩවා ස්ථිර ව පවත්වා ගෙන යන විට ශුද්ධ වූ සභාව අපෝස්තලික වේ. අපෝස්තලික ඉගැන්වීම අනුව මුල් කිතුනුවෝ තම ජීවිත සකස් කර ගත්හ (ක්‍රියා 2:42). එලෙස ම සැම කල්හි ම සැම කිතුනුවෙක් ම අපෝස්තුලුවරුන්ගෙන් ලැබී ඇති සියල්ල කෙරෙහි විශ්වාසවන්ත ව කටයුතු කිරීමට බැඳී ඇත්තේ ය. තව ද ශුද්ධ වූ සභාව අපෝස්තුලුවරුන්ගේ අත්තිවාරම මත ඉදිකර ඇත.

අපගේ විශ්වාසය අනුව ප්‍රකාශ කරන “එක ම, ශුද්ධ වූ, කතෝලික හා අපෝස්තලික සභාව” පේදුරුතුමාගේ අනුප්‍රාප්තිකයන් හා රදගුරුතුමන්ලා විසින් පාලනය කරනු ලබන කතෝලික සභාව තුළ පවතින බව දෙවන වතිකානු මන්ත්‍රණ සභාවේ ශුද්ධ වූ සභාව පිළිබඳ ප්‍රකාශයේ අංක 8හි සඳහන් වේ. එය අපගේ විශ්වාසය වන්නාසේ ම එම විශ්වාසයට පක්ෂපාතී ව ජීවත් වීමට වෙර දරමු.

### ක්‍රියාකාරකම

1. ශුද්ධ වූ සභාවේ “ඒකත්වය” වර්ධනය කිරීමට ඔබට කළ හැකි කාර්යයන් **දෙකක්** ලියන්න.
2. ශුද්ධ වූ සභාවේ සාමාජිකයකු ලෙස, ශුද්ධවන්ත ජීවිතයක් ගත කිරීමට ඔබට ලැබී ඇති කැඳවීම අනුව ඔබ කළ යුතු කාර්යයන් **තුනක්** ලියන්න.
3. ශුද්ධ වූ සභාවේ “කතෝලිකත්වය” වර්ධනය කිරීමට ඔබට කළ හැකි කාර්යයන් **පහක්** ලියන්න.



***ජීවිතයට බිඳක්***

*බොහෝ අවයව තිබෙන නමුත් ඇත්තේ එකම ශරීරයකි.*



නොමිලේ බෙදාහැරීම සඳහා ය.